# ACCOUNTING EQUATION (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# <u>මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය</u>

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය යනු ව්‍යාපරයේ යම් නිශ්චිත දිනකට පැවති වත්කම් වගකීම් හා හිමිකම් අතර පවතින සම්බන්ධතාව නිරූපණය කරන ලේඛනයයි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන්ට තොරතුරු ලබා දීම සඳහා පිළියෙල කරන මූල්‍ය වාර්තාවක් වන අතර, එමගින් ව්‍යාපාරයක මූල්‍ය තත්ත්වය නිරූපණය කරයි.

ව්‍යාපාරයක අයිතිකරුවන් යොදන ප්‍රාග්ධනයට ලාභ/අලාභ හා ගැනිලි ගැලපීමෙන් පසුව ලැබෙන අගය හිමිකම ලෙස හඳුන්වයි

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ගිණුම්කරණ සමීකරණ ආශ්‍රයෙන් ද පිළියෙල කළ හැකිය.

ClassWork.LK

## අභ්‍යාස

(1). පහත සඳහන් පද සුදුසු තැන්හි යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

( ගැලපුම් සංකල්පය, ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ශුද්ධ වත්කම්, ලාභය/අලාභය )

(i) යම් නිශ්චිත කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා .................................................. පිළියෙල කරයි.

(ii) යම් නිශ්චිත කාල සීමාවක ඉපයූ ලාභය හෝ අලාභය සෙවීමට ආදායම් ඉපයීමට අදාළ වියදම් සම්බන්ධ කර ගන්නේ .................................................. ට අනුවයි.

(iii) ව්‍යාපාරයක යම් නිශ්චිත දිනකට වත්කම්, වගකීම් හා හිමිකම් දැක්වෙන ලේඛනය .............................. ලෙස හැඳින්වේ.

(iv) ආදායම් ප්‍රකාශනයේ ප්‍රධාන අරමුණ ව්‍යාපාරයක නිශ්චිත කාල සීමාවක් සඳහා .................................................. ගණනය කිරීමයි.

(v) ව්‍යාපාරයක හිමිකම ............... ලෙස ද හඳුන්වනු ලැබේ.

ClassWork.LK

**(2)** රජිත විසින් පවත්වා ගෙන යනු ලබන සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ **2017** ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනු හා සිද්ධීන් පහත ආකෘතිය යටතේ ගිණුම්කරණ සමීකරණයට ඇතුළත් කර ඇත.

| | | වත්කම් | | | = | වගකීම් | + | හිමිකම් |
|---|---|---|---|---|---|---|---|---|
| ගනුදෙනු අංකය | ඉඩම් හා ගොඩනැගිලි | + තොගය | + ණයගැතියෝ | + මුදල් | | බැංකු ණය | + ණයහිමියෝ | + හිමිකම |
| (i) | ........ | + 80 000 | ........ | - 80 000 | = | ........ | ........ | ........ |
| (ii) | ........ | + 150 000 | + 250 000 | ........ | = | ........ | ........ | 100 000 |
| (iii) | ........ | ........ | - 30 000 | - 28 000 | = | ........ | ........ | + 2 000 |
| (iv) | | ........ | ........ | 1000 000 | = | ........ | ........ | ........ |
| (v) | ........ | ........ | ........ | - 36 000 | = | ........ | - 40 000 | - 4 000 |
| (vi) | ........ | ........ | ........ | - 15 000 | = | - 42 000 | ........ | - 3 000 |
| (vii) | ........ | - 8 000 | ........ | ........ | = | ........ | ........ | - 8 000 |
| (viii) | | ........ | ........ | ........ | = | ........ | ........ | - 10 000 |
| (ix) | ........ | ........ | ........ | + 1200 000 | = | ........ | ........ | 1200 000 |
| (x) | ........ | - 2 000 | ........ | ........ | = | ........ | ........ | - 2 000 |
| (xi) | ........ | + 40 000 | ........ | ........ | = | ........ | + 40 000 | ........ |
| (xii) | ........ | ........ | ........ | - 12 000 | = | ........ | ........ | - 12 000 |

ClassWork.LK

අතිරේක තොරතුරු :

අ. ගනුදෙනු අංක vii, ix ලාභයට බලපෑමක් ඇති නොකරයි.

ආ. 2017/01/01 දිනට ව්‍යාපාරයේ පැවති වත්කම් හා වගකීම් පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| ඉඩම් ගොඩනැගිලි | රු. 1 000 000 |
| තොගය | රු. 200 000 |
| ණයගැතියෝ | රු. 900 000 |
| මුදල් | රු. 280 000 |
| බැංකු ණය | රු. 180 000 |
| ණයහිමියෝ | රු. 70 000 |

1. ඉහත ආකෘතියේ ඇතුළත් කර ඇති එකිනෙක ගනුදෙනුව හෝ සිද්ධිය විස්තර කරන්න.

2. 2017 ජනවාරි මාසය සඳහා ආදායම් ප්‍රකාශනය පිළියෙල කරන්න.

3. 2017 ජනවාරි 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරන්න.

ClassWork.LK

**(03)** පහත දැක්වෙන ප්‍රකාශයෙන් අතුරින් වැරදි ප්‍රකාශය තෝරන්න.

(i) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක් මගින් යම් නිශ්චිත දිනකට ව්‍යාපාරයක වත්කම්, වගකීම්, හිමිකම් දක්වයි.

(ii) ශුද්ධ වත්කම් ප්‍රවේශයෙන් ලාභය සෙවීමේදී ගැනිලි අඩු කළ යුතුයි.

(iii) ආදායම් ප්‍රකාශනයක මූලික අරමුණ මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීමයි.

(iv) ගිණුම්කරණ සමීකරණයේ ඇතුළත් හිමිකම වෙනස් වීමට අදාළ ගනුදෙනු ආශ්‍රයෙන් ආදායම් ප්‍රකානයක් පිළයෙල කළ හැකිය.

(v) ආදායම් ප්‍රකාශනයේ තොරතුරු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමට අවශ්‍ය ම නොවේ.

ClassWork.LK

(04) පහත දැක්වෙන ප්‍රකාශය සත්‍ය නම් (✓) ලකුණද, අසත්‍ය නම් (x) ලකුණ ද ප්‍රකාශය ඉදිරියෙන් දැක්වීම.

1. ගිණුම්කරණ සවීකරණය මගින් ව්‍යාපාරයක වත්කම් හා ඒවායේ අයිතිය අතර ඇති සම්බන්ධය දක්වයි. (     )

2. ශුද්ධ වත්කම් ප්‍රවේශයෙන් ලාභ/ අලාභ සෙවීමේ දී අවසාන ශුද්ධ වත්කම්වලින් ආරම්භක ශුද්ධ වත්කම අඩු කර, ගැනිලි හා අමතර ප්‍රාග්ධනය අඩු කළ යුතුයි. (     )

3. ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී ගැලපුම් සංකල්පය යොදා ගනී. (     )

4. ව්‍යාපාර ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය සටහන් කිරීමෙන් පසුව ඒ ඇසුරින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක් පිළියෙල කළ හැකි ය. (     )

5. මුදල් ගැනිලි හා අමතර ප්‍රාග්ධනය ලාභයට හෝ අලාභයට බලපෑමක් ඇති නොකරයි. (     )

Class Work LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of Sri Jayewardenepura